ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා/ ස්වභාවික විද්‍යා ගෞරව
උපාධි වැඩසටහන - 2023/2024
හයවන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
**SNU6212 - අන්තර්කරණ අධ්‍යාපනය**
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2024.12.20 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 01 - වන කොටස

01. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය යන යෙදුම පැහැදිලිකර, ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේදී එහි ඇති වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න.

02. අන්තර්කරණ පන්ති කාමරයක ශ්‍රවණ ඌනතා සහිත සිසුන්ට උපකාර කිරීමට භාවිත කළ හැකි ඉගැන්වීමේ උපායමාර්ග තුනක් (03) ලැයිස්තු ගත කරන්න.

03. ඵලදායි අන්තර්කරණ අධ්‍යාපනය සඳහා පොදු බාධක පහක් (05) ලයිස්තුගත කරන්න.

04. අන්තර්කරණ පන්තිකාමරය තුළ ගුරුවරුන් මුහුණදෙන අභියෝග තුනක් (03) සඳහන් කර ඉන් එක් අභියෝගයක් තෝරා එයට ඵලදායි ලෙස ආමන්ත්‍රණය කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. අධ්‍යාපන සන්දර්භය තුළ ඒකීකරණය සහ අන්තර්කරණය අතර ප්‍රධාන වෙනස්කම් දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. දුබලතා සහිත දරුවන්ගේ අවශ්‍යතා සඳහා ආමන්ත්‍රණය කිරීමේදී පුද්ගල බද්ධ ඉගෙනුම් සැලසුම්වල (IEPs) වැදගත්කම් තුනක් (03) ලයිස්තුගත කරන්න.

07. අන්තර්කරණ පන්තිකාමරයක ගුරුවරයෙකු ලෙස, ලිවීමේ දුෂ්කරතා සහිත දරුවන් හඳුනාගන්නේ කෙසේද? ඒ සඳහා ඔබ ගන්නා පියවර පැහැදිලි කරන්න.

08. බුද්ධිමය දුබලතා සහ ශාරීරික දුබලතා අතර, ප්‍රධාන වෙනස්කම් තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05x08=40)

## 02 - කොටස

09. (i.) අන්තරකරණ පන්තිකාමරයකදී ඩවුන්ගේ සහ ලක්ෂණය (Down Syndrome) සහිත සිසුන් මුහුණ දෙන අධ්‍යාපනික අභියෝග තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) ඩවුන්ගේ සහ ලක්ෂණය (Down Syndrome) සහිත සිසුන් සඳහා වඩා හොඳ සහයක් ලබාදීමට ගුරුවරුන් විසින් ඔවුන්ගේ ඉගැන්වීමේ උපායමාර්ග අනුගත කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) ඩවුන්ගේ සහ ලක්ෂණය (Down Syndrome) සහ මස්තිෂ්ක ආඝාතය (Cerebral Palsy) අතර ඇති ප්‍රධාන වෙනස්කම් දෙකක් **(02)** කෙටියෙන් සංසන්දනය කරන්න. (ලකුණු 08)

10. (i.) ඔටිසම් පරාසිය අක්‍රමතාව (Autism Spectrum Disorder) සහ ඌන අවධාන අධික්‍රියාකාරිත්වය (Attention Deficit Hyperactive Disorder) සහිත සිසුන්ට අන්තර්කරණ පන්තිකාමරයක මුහුණදිය හැකි අභියෝග තුන **(03)** බැගින් නම් කරන්න. (ලකුණු 06)

(ii.) ඉහත ඔබ විසින් නම් කරන ලද එක් අභියෝගයක් තෝරාගෙන පූර්ව සේවා ගුරුවරයෙක් වශයෙන් එම අභියෝගය ජය ගැනීම සඳහා ඔබ යෝජනා කරන විසඳුම් දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) ඉහත ඔබ විසින් යෝජනා කරන විසඳුම් වලින් එක් විසඳුමක් තෝරාගෙන එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නේ කෙසේදැයි නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

11. (i.) ශ්‍රී ලංකීය පන්තිකාමර තුළ අන්තර්කරණ අධ්‍යාපන භාවිතයන් ක්‍රියාත්මක කිරීමේදී ගුරුවරුන් මුහුණ දෙන ප්‍රධාන අභියෝග තුනක් **(03)** නම් කරන්න. (ලකුණු 03)

(ii.) පූර්වසේවා ගුරුවරන්ට අන්තර්කරණ භාවිතයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සහ පුහුණුවක් අවශ්‍ය වන්නේ මන්දැයි සුදුසු නිදසුන් දෙකක් **(02)** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 07)

(iii.) අන්තර්කරණ පන්ති කාමර පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ අනුගමනය කළ හැකි නිර්මාණාත්මක උපායමාර්ග පහක් **(05)** යෝජනා කරන්න. (ලකුණු 10)

12. (i.) 1980 දී ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් අර්ථ දක්වා ඇති පරිදි ඌනතාවය, දුබලතාවය හා බාධිත බව යන යෙදුම් අතර, වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) ඉහත වෙනස්කම් අවබෝධකරගැනීම තුළින් පූර්ව සේවා ගුරුවරුන්ට විවිධ අවශ්‍යතා සහිත සිසුන් සඳහා වඩාත් උචිත අන්තර්කරණ පන්තිකාමරයක් නිර්මාණය කිරීමට උපකාරී විය හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii.) ශ්‍රී ලාංකික පන්තිකාමරයක් තුළ දුබලතා සහිත සිසුවෙකුට බාධකවලට මුහුණ දීමට සිදුවිය හැකි තත්ත්වයක් ප්‍රත්‍යාවේක්ෂණය කර එම බාධක අවම කිරීම සඳහා උපායමාර්ග දෙකක් **(02)** යෝජනා කරන්න. (ලකුණු 08)

13. (i.) සුහග සහ සහජ දක්ෂතා සහිත සිසුන් සහ ඉගෙනුම් දුබලතා සහිත සිසුන් අතර, පවත්නා ප්‍රධාන වෙනස්කම් තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 06)

(ii.) අන්තර්කරණ පන්තිකාමරයක ගුරුවරයෙකු ලෙස ඔබට සුහග සහ සහජ දක්ෂතා සහිත සිසුන්ගේ සහ ඉගෙනුම් දුබලතා සහිත සිසුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා යොදාගතහැකි නිර්මාණාත්මක ඉගැන්වීමේ උපායමාර්ග දෙකක් **(02)** විස්තරකරන්න.
(ලකුණු 06)

(iii.) දෙමාපියන්ගේ සහ විශේෂඥයින්ගේ යන දෙපිරිසගේම සහයෝගීතාවයෙන් ඉගෙනුම් අත්දැකීම් වැඩිදියුණු කළහැකි ආකාර තුනක් එක් උදාහරණය බැගින් සපයමින් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

14. (i.) අන්තර්කරණ පන්තිකාමරයක් තුළ දෘෂ්ටි ඌනතා සහිත සිසුන් මුහුණදෙන පොදු අභියෝග තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) ඉහත අභියෝග ඔවුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට බලපාන ආකාරය අවම වශයෙන් උදාහරණ දෙකක් ලබාදෙමින් කෙටියෙන් සාකච්ඡා කරන්න
(ලකුණු 06)

(iii.) අන්තර්කරණ පන්තිකාමරයක දෘෂ්ටි ඌනතා සිසුන්ට උපකාර කිරීම සඳහා ගුරුවරයාට වැඩිදියුණුකල හැකි ඉගැන්වීමේ උපායමාර්ග හෝ පන්තිකාමර අනුවර්තනයන් **පහක් (05)** යෝජනා කරන්න. (ලකුණු 08)

-හිමිකම් ඇවිරිණි.-